සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade: 11 ශ්‍රේණිය	කතෝලික ධර්මය I, II	කාලය / நேரம் / Time: පැය 03යි

නම / பெயர் / Name: .....

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- **ප්‍රශ්න අංක 1 සිට 40 දක්වා ඇති සියලුම ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.**

01. උත්පත්ති 9:1-17 දක්වා ඇති නෝවා සමග කළ ගිවිසුම අයත් සම්ප්‍රදාය වනුයේ මින් කුමක්ද ?
1. යාවේ සම්ප්‍රදාය 2. එලෝහිම් සම්ප්‍රදාය 3. ද්වීතිය නීති සම්ප්‍රදාය 4. පූජක සම්ප්‍රදාය

02. ක්‍රිස්තියානි බයිබලයේ පුරාණ ගිවිසුමට ඇති පොත් ගණන වනුයේ
1. 27 2. 46 3. 39 4. 73

03. ද්වීතිය සම්මත ග්‍රන්ථයක් නොවන්නේ මින් කුමක්ද?
1. විලාප ගී 2. ජුඩිත් 3. බාරුක් 4. උපදේශකයා හෙවත් සිරාක්

04. දේශක දිවැසිවරුන් පමණක් අයත් පිළිතුරු කණ්ඩය වනුයේ
1. මිකායා, මීකා, හුල්දා 2. නාතාන්, මීකායා, එළියා
3. එලියා, එලිෂා, යෙසායා 4. ජෝනා, අභියා, හොසියා

05. දෙවියන් වහන්සේ වැඩ සිටින උන්වහන්සේගේ දේවස්ථානය තුළ භක්තිවන්ත හැසිරීම අපගේ යුතුකම බව පෙන්වා දෙන දිවැසිවරයා වූයේ
1. එසකියෙල් 2. මීකා 3. යෙසායා 4. ජෙරමියා

06. ස්නාවක ජොහාන් තුමා පාළුකරයේ සිදුකළ දේශනයකින් තම සුබාරංචිය ආරම්භ කරන සුවිශේෂක කතුවරයා වූයේ,
1. මාක් තුමා 2. ලූක්තුමා 3. මතෙව් තුමා 4. ජොහාන් තුමා

07. දෙවියන් වහන්සේ හා මිනිසා අතර ඇති විශේෂ සම්බන්ධතාව පෙන්නුම් කරන්නේ මින් කුමකින්ද?
1. දේව ස්වරූපයට මිනිසා මැවීම
2. මිනිසාට පමණක් ජීවන හුස්ම දානය කිරීම
3. අනෙකුත් මැවිලි වලට වඩා උසස් බුද්ධියක් තිබීම
4. අමරණීය ආත්මයක් තිබීම

08. උත්පත්ති පොතේ තුන් වන පරිච්ඡේදයේ දැක්වෙන සර්පයාගෙන් සංකේතවත් කරන්නේ
1. ස්ත්‍රිය තුළ ඇති රුචිය 2. රුචිය යහපත් හෝ අයහපත් නොවන බව
3. පාපය හා එහි විපාක 4. මිනිසා තුළ ඇති රුචිය

Past Papers Wiki

09. මිසර වැසියන් වෙත පැමිණි හත්වන හා අට වන වසංගතය වනුයේ
1. ගඩු හා ගල් වරුෂා උවදුර
2. පළගැටි උවදුර හා ඝනදුරු උවදුර
3. ගල් වරුෂා හා පළගැටි උවදුර
4. මැසි හා ගඩු උවදුර

10. දෙවියන් වහන්සේ ආදි මව්පියන් සමග ගිවිසුම ඇති කර ගැනීමට පසුබිම වූයේ
1. ආදිමව්පියන් දේව හඬට පිටු පා අකීකරු වීම
2. තහනම් ගහේ ගෙඩි කෑම
3. දේව පුත්‍රයා මෙලොවට එවීමට තීරණය කළ නිසා
4. සර්පයා ඒව රැවටීම

11. දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමග කළ ගිවිසුම දක්වා ඇති සම්ප්‍රදායන් දෙක අඩංගු පිළිතුර
1. D හා E
2. P හා E
3. J හා P
4. J හා D

12. සාමාන්‍ය එඩේරික ජීවිතයක් ගත කළ ඊශ්‍රායෙල් ජනතාව සුවිශේෂී දේව ජනතාවක් බවට පත් වූයේ
1. නික්මයාම තුළින්
2. සීනයි ගිවිසුම තුළින්
3. ගිවිසුම් කරඩුව මගින්
4. මෝසෙස් තුමා මගින්

13. "ඔබට ලැබෙන වැටුපෙන් සෑහි සිටින්න" යැයි ස්නාවක ජොහාන් තුමා දේශනා කරන්නේ කුමන ජන කොට්ඨාසයකටද?
1. සාමාන්‍ය ජනතාවට
2. අයකැමියන්ට
3. පරිසිවරුන්ට
4. සෙබලුන්ට

14. ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතයේ දූත මෙහෙර ආරම්භ වන්නේ
1. පෙන්තකොස්ත දින
2. ප්‍රසාද ස්නාපනයෙන්
3. ත්‍රිවිධ පරීක්ෂා වලට සාර්ථකව මුහුණ දීමෙන්
4. ස්නාවක ජොහාන් තුමාගේ දේශනයෙන්

15. පූජක වරයෙහි පූර්ණත්වය හිමි වන්නේ
1. තේවාචාර්ය ධූර්යට
2. පාප් ධුරයට
3. රාජගුරුප්‍රසාදි ධූරයට
4. කාදිනල් ධූරයට

16. "දෙවියන් වහන්සේ එක් කළ අය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා"මෙය සඳහන් වන්නේ ශුද්ධ බයිබලයේ
1. උත්පත්ති 3
2. මාක් 10:9
3. උත්පත්ති 1:2-8
4. ලූක් 4:5

17. තාපස දිවියේ පුරෝගාමියෙකු ලෙස සලකනු ලබන්නේ මින් කවුරුන්ද?
1. පැකොමියස් තුමා
2. ජෙරොම් තුමා
3. අගොස්තිනු තුමා
4. අම්බ්‍රොස් තුමා

18. මුල් අවධියේ සිටම පෙරදිග හා අපරදිග යන කතෝලික සභා දෙකෙහිම දේව වන්දනා සම්ප්‍රදායන් තුළ රෝගීන්ගේ ආලේප කිරීමේදී දැකිය හැකි චාරිත්‍රය වූයේ,
1. සියලු දෙනා රැස්වීම
2. ශුද්ධ වූ තෙලයෙන් ආලේප කිරීම
3. සභාවේ වැඩිහිටියන් කැඳවීම
4. සක්‍රමේන්තු ලබා දීම

19. විශේෂයෙන් විවිධ ගැටළුවලට මුහුණදුන් තරුණියන් පුනරුත්ථාපනය කරනු ලබන පැවිදි සොහොයුරියන්ගේ නිකායක් වූයේ මින් කුමක්ද?
1. සුරදූත පැවිදි නිකාය
2. දයාවේ සහෝදරියෝ
3. ශුද්ධ වූ පවුලේ නිකාය
4. යහපත් එඩේරාගේ පැවිදි නිකාය

20. කිතුනු දිවියේ කේන්ද්‍රස්ථානය වනුයේ මින් කුමක්ද?

1. පවුල 2. දිව්‍ය සත්ප්‍රසාදය 3. දේවස්ථානය 4. මීසම

21. දිවැසිවර කාර්යයෙහි ප්‍රධාන දූත සේවාවක් වන්නේ

1. ධර්මදානයයි
2. ක්‍රිස්තුන් වහන්සේගේ පෙරමග සැලසීම
3. ගැටලු විසඳීම
4. ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් පෙනී සිටීමයි

22. මරියතුමියගේ මධ්‍යස්ථකම හා සහා ශ්‍රේෂ්ඨයින්ගේ මග පෙන්වීම තුළ ගිහියන් සඳහා ගිහියන් විසින් පවත්වා ගෙන යනු ලබන ශුද්ධවන්තභාවයේ ප්‍රබල ගිහි අපෝස්තලික සේවාවක් වනුයේ

1. YCS
2. සාන්ත වින්සෙන්ති ද පාවුලා සමිතිය
3. ලෙජියෝ මරියේ
4. දිව්‍ය හෘදය සමිතිය

23. දෙවි මිනිස් සංවාදය සඳහා කිතු සමිදුන් අපට ලබා දුන් පූර්වාදර්ශය වන්නේ

1. මල් උයනේ යාච්ඤාව
2. ස්වාමීවාක් ආරාධනාව
3. භාග්‍ය අට
4. කන්ද උඩ දේශනාව

24. පුද්ගලයින් හෝ ජනතාවගේ ගැටලු හා ඒවාට විසඳුම් දේව වේදීය දෘෂ්ටි කෝණයකින් ඉදිරිපත් කර ඇති ශුද්ධ බයිබලයේ ජනප්‍රිය කෘති දෙක වනුයේ

1. රූත් සහ එස්රා 2. ජුඩිත් සහ එස්තර් 3. එස්රා සහ නෙහෙමියා 4. රූත් සහ එස්තර්

25. ද්විතීය පාවුලු සංදේශයක් නොවන්නේ

1. 2 තෙසලෝනික 2. 1 තෙසලෝනික 3. තීතස් 4. කොලොස්සි

26. පරම යහපත හා අයහපත අතර ගැටුමෙන් අනාගත දිනයකදී පරම යහපත ජයග්‍රහණය කර සියලු නපුරු බලවේග විනාශ වී ඇදහිලිවන්තයින් උදෙසා සෞභාග්‍යවත් කාලයක් උදාවන බව දක්වන එළිදරව් වාදයේ ලක්ෂණය වනුයේ,

1. යුගාන්තවාදය 2. ද්විත්ව්වාදය 3. සංකේත භාවිතය 4. එළිදරව්වාදය

27. ශුද්ධ වූ සභාවේ උපන් දිනය ලෙස සළකනු ලබන්නේ

1. නත්තල් දින
2. පාස්කු දින
3. පෙන්තකොස්ත දින
4. අහස් නැගීමේ මංගල්‍යය

28. ජේසුස් වහන්සේගේ මෘත ශරීරය කුරුසියෙන් බා භූමදාන කටයතු සිදු කිරීමට අරමාතියේ ජෝසප් ඉල්ලා සිටියේ

1. හෙරෝද් 2. පිලාත් 3. අන්නාස් 4. කයිපාස්

29. ජීවිත හරය, එහි ගැටලු, විනිශ්චය පිළිබඳ සංකල්පනා ආශ්‍රිතව විග්‍රහ කරන හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේදය වනුයේ,

1. පවුල හා ගෝත්‍රික ප්‍රඥාව
2. රාජ්‍ය සභා ප්‍රඥාව
3. එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව
4. අභිධාර්මික ප්‍රඥාව

30. ක්‍රි.ව. 6 දී ශු.පාවුලු තුමාගේ හිස ගසා මරණයට පත් කරනු ලැබූ අධිරාජ්‍යයා වනුයේ

1. දියොක්ලෙසියානු 2. ඩෙසියස් 3. නීරෝ 4. ට්‍රාජන්

31. ශුද්ධ වූ සභාවේ ලක්ෂණ අතරින් "කතෝලිකත්වය" යනු

1. සාධාරණත්වය 2. විශ්වීය බව 3. ශුද්ධවන්තබව 4. එකමුතුකම

32. අනුරාධපුරයෙහි රදගරු හිමිපාණන්ගේ තනතුර දරණුයේ

1. අති උතුම් නෝබට් අන්දාදි (නි.ම.නි) රදගුරු හිමිපාණන්
2. අති උතුම් ක්ලීටස් චන්දසිරි පෙරේරා රදගුරු හිමිපාණන්
3. අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා රදගුරු හිමිපාණන්
4. අති උතුම් වැලන්ස් මෙන්ඩිස් රදගුරු හිමිපාණන්

33. නූතන කිතුනු ලොවේ විශාලවූත් එමෙන්ම මැනවින් සංවිධානය වූත් ගිහි ධර්මදූත ව්‍යාපාරයක් වනුයේ

1. කතෝලික දහම් පාසල 2. දිව්‍ය හෘදය සමිතිය
3. තරුණ කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරය 4. මරිය හමුදාව

34. නැගෙනහිර හා බටහිර ජර්මනිය වෙන් කළ බර්ලින් තාප්පය බිඳ දමා රට එක්සත් කිරීමට මූලික වූ පාප්තුමා වූයේ,

1. ශුද්ධ වූ හයවන පාවුලු පාප්තුමා 2. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු පාප්තුමා
3. ශුද්ධ වූ ෆ්‍රැන්සින් පාප්තුමා 4. ශුද්ධ වූ 23 වන ජුවාම් පාප්තුමා

35. ගරු මයිකල් රුදිගෝ පියතුමා අයත් නිකාය වනුයේ

1. පදවි පූජක 2. ෆ්‍රැන්සිස්කන් නිකාය 3. නිර්මල මරිය නිකාය 4. ජේසු නිකාය

36. දෙවියන් වහන්සේට යාච්ඤා කිරීමට අතපසු කිරීම මගින් කඩවන පනත වනුයේ

1. පළමු පනත 2. දෙවන පනත 3. තෙවන පනත 4. සිව්වන පනත

37. ශුද්ධ වූ පාවුලු තුමා දරුවන්ට හා දෙමාපියන්ට අවවාද කරනුයේ කුමන ලිපියේද?

1. රෝම ලිපියේ 2. කොරින්ති ලිපියේ 3. ගලාති ලිපියේ 4. එපීස ලිපියේ

38. මවට ද පියාට ද ගෞරව කරන්න යන පනත කඩ වන අවස්ථාවක් වනුයේ

1. පොදු දේපළ විනාශ කිරීම 2. සාමය වෙනුවෙන් ඉදිරිපත් නොවීම
3. දික්කසාද වීම 4. අසභ්‍ය වචන භාවිතය

39. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ, දේව මාතාවන්ගේ හා ශුද්ධවරයන්ගේ මංගල්‍යවලදී භාවිතා කරන වර්ණය වනුයේ,

1. රතු 2. සුදු 3. කොළ 4. දම්

40. සුරදූත ගීය ගායනා නොකරන කාල පරිච්ඡේද වනුයේ,

1. ආගමන හා පාස්කු කාලය 2. නත්තල් හා පාස්කු කාලය
3. චතාරික හා පාස්කු කාලය 4. චතාරික හා ආගමන කාලය (ලකුණු 1x40-40)

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	කතෝලික ධර්මය - II	කාලය / நேரம் / Time

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

---

(01) 01. පූජක සම්ප්‍රදායට අයත් කතා පුවත් දෙක නම් කරන්න

02. ද්විතීය සම්මත ග්‍රන්ථ දෙකක් නම් කරන්න

03. දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ දෙකක් ලියන්න

04. මිසර වැසියන් වෙත පැමිණි 3 හා 4 වෙනි වසංගත නම් කරන්න

05. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කරගත් ගිවිසුමෙහි අඩංගු ප්‍රධාන කරුණු දෙක ලියන්න

06. දේව රාජ්‍යයේ වටිනාකම් දක්වන උපමා දෙකක් ලියන්න

07. ශුද්ධ වූ මතෙව් සුවිශේෂයේ 5,6,7 පරිච්ඡේදවල අඩංගු කන්ද උඩ දේශනාවෙහි අන්තර්ගත ඉගැන්වීම් දෙකක් ලියන්න

08. මනස්ථාපය දෙයාකාර වේ. නම් කරන්න

09. කිතුනු විවාහයේ ලකෂණ දෙක නම් කරන්න

10. මැවීම පිළිබඳ දෙවන කතාවෙහි දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ වගකීම් දෙක මොනවාද?

(ලකුණු 2x10 =20)

(02) 1. ඊශ්‍රායෙල් දිවැසිවරු බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 2)

2. යාවේ සම්ප්‍රදායට අයත් කතා පුවත් තුන නම් කරන්න. (ලකුණු 3)

3. ඊශ්‍රායෙල් දිවැසිවරුන්ගේ ජීවිත තුළින් බෞතිස්මයෙන් අපට ලැබෙන්නාවූ දිවැසිවර කාර්යය ඉටු කිරීමට ලැබෙන මග පෙන්වීම් පහක් ලියන්න. (ලකුණු 5)

(03) 1. ජන වන්දනාව යන්න හඳුන්වන්න. (ලකුණු 2)

2. ජන වන්දනාවේ ප්‍රධාන අංග තුන දක්වන්න. (ලකුණු 3)

3. ඔබ මීසම තුළ ජනවන්දනාව (දේව වන්දනා) මෙහෙයන් අර්ථවත් කර ගැනීමට කළ හැකි කාර්යයන් පහක් ලියන්න (ලකුණු 5)

PAST PAPERS WIKI

(04) 1. ස්නාවක ජොහාන් තුමාගේ දේශනාව යොමු වූ ජන කොට්ඨාස දෙකක් නම් කරන්න. (ලකුණු 2)

2. ප්‍රතිහාර්ය වර්ග තුනක් නම් කර ඊට අදාළ උදාහරණය බැගින් ලියන්න. (ලකුණු 3)

3. කිතුනු සිසුවකු වන ඔබ දේව රාජ්‍යය පතල කිරීම සඳහා ගන්නාවූ ක්‍රියා මාර්ග පහක් විස්තර කරන්න. (ලකුණු 5)

(05) 1. ජනතා සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න. (ලකුණු 2)

2. නිල පූජකවරයෙහි ධූර තුන නම් කරන්න. (ලකුණු 3)

3. යහපත් පවුල් දිවියක් ගත කිරීමට නම් ඔබ යොජනා කරන යහපත් ක්‍රියා මාර්ග පහක් ලියන්න. (ලකුණු 2)

(06) 1. උත්පත්ති 1:26 දෙවියන් වහන්සේ මිනිසා මවා ඇත්තේ කෙසේද? (ලකුණු 2)

2. රාදා, අබාද්, ෂාමාර් යන හෙබ්‍රෙව් වචන වල අර්ථය ලියන්න. (ලකුණු 3)

3. වර්තමාන සමාජය තුළ පරිසරය සුරැකීමේ හා වර්ධනය කිරීමේ කිතුනු වගකීම පණ ගැන්වීමට ඔබට කළ හැකි ක්‍රියාකාරකම් පහක් පැහැදිළි කරන්න. (ලකුණු 5)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න (වචන 75-100 අතර)

1. යාම යැදුම
2. මරිය බැතිය
3. ආත්මික හා ශාරීරික පුනාය ක්‍රියා
4. දිව්‍ය පූජාව (ලකුණු 5x2=10)

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank